**ශීර්ෂය 119 - විදුලිබල අමාත්‍යාංශය**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මතය**
**------**

විදුලිබල අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මාර්තු 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව යම් කිසි නිශ්චිත දිනකට එක් එක් වියදම් ශීර්ෂ සඳහා වූ බැදීම් හා බැරකම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා සෑම වියදම් ඒකකයන් විසින්ම දිනපතා තම බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු www.newcigas.treasury.gov.lk වෙබ් අඩවියට උත්පනය කළ යුතු බව සඳහන් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ ආරම්භයේ සිට අදාළ තොරතුරු පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලින කල යුතු වීම. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 10.1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 හි ඡේද අංක 06 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමට සැකසිය යුතු වුවද, එය මුදල් පදනමට සැකසීම මත පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) අමාත්‍යාංශ පොත් අනුව ආදායම් නොවන ලැබීම් රු.73,502,415 ක් මුදල් ප්‍රවාහයක් ලෙස දක්වනු වෙනුවට රු.271,106 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. තවද, අමාත්‍යාංශ පොත්වල ඇතුළත් නොවූ වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් රු.84,869 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ප්‍රවාහ ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශය විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් පදනම මත සකස් කර ඇති බව | මාර්ගෝපදේශ අනුගමනය කරමින් ගිණුම්ගත කිරීම විධිමත් කලයුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) අමාත්‍යාංශ පොත් අනුව අග්‍රිම ලැබීම් රු.214,311,106 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.214,176,985 ක් ලෙස සටහන් කිරීමෙන් රු.134,121 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |
| (iii) අමාත්‍යාංශ පොත් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු.157,691,642 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.150,891,122 ක් ලෙස සටහන් කිරීමෙන් රු.6,800,520 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |
| (iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර හා මාරුකිරීම් වෙනුවෙන් දරන ලද වියදම් රු.13,369,188 ක් දක්වා තිබුණද, අමාත්‍යාංශ පොත් අනුව එම වටිනාකම රු.12,992,632 ක් වූයෙන් වෙනස රු.376,555 ක් විය. | එම | එම |
| (v) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.17,905,765 ක් දක්වා තිබුණද, අමාත්‍යාංශ පොත් අනුව එම වටිනාකම රු.104,906,178 ක් වූයෙන් වෙනස රු.87,000,413 ක් විය. | එම | එම |
| (vi) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අක්මුදල් පියවීම රු.5,577,197 ක් දක්වා තිබුණද, අමාත්‍යාංශ පොත් අනුව එම වටිනාකම රු.6,145,370 ක් වූයෙන් වෙනස රු.568,173 ක් විය. | එම | එම |

| | | | |
|---|---|---|---|
| | (vii) අමාත්‍යාංශ පොත් අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු.11,094,783 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.626,863 ක් ලෙස දක්වා තිබීම නිසා රු.10,467,920 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |
| | (viii) අමාත්‍යාංශ පොත් අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 11,685,700 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.3,427,350 ක් ලෙස දක්වා තිබීම නිසා අත්තිකාරම් ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.8,258,350 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | එම | එම |
| | (ix) මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ රු.1,565,680 ක් තැන්පතු ලැබීම් ලෙස දක්වා තිබුණද, අමාත්‍යාංශ පොත් අනුව එම වටිනාකම රු.2,855,336 ක් වූයෙන් වෙනස රු.1,289,656 ක් විය. | එම | එම |
| | (x) මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ තැන්පතු ගෙවීම් ලෙස රු.2,517,587 ක් දක්වා තිබුණද, අමාත්‍යාංශ පොත් අනුව එය රු.3,504,886 ක් වූයෙන් රු. 987,299 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |
| (ආ) | 2008.02.06 අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව මහජනයාට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය වන පසුබිම සැකසීමට අමාත්‍යාංශය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර නොතිබුණි. | පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයට සුවිශේෂී වු මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවත් චක්‍රලේඛය අනුව අන්තර්ගත විය යුතු කරුණු ඇතුළත් වන පරිදි සැලසුම සකස් කර නොතිබූ අතර අමාත්‍යාංශයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මාගේ අංක PE/IA/104 VoI..I හා 2021.03.18 දිනැති ලිපිය මගින් මානව සම්පත් සැලැස්මෙහි පිටපත ඔබ වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අන්තර්ගත විය යුතු කරුණු ඇතුලත් වන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව සියලුම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල වාර්තා විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද, අමාත්‍යාංශයේ වාහන වලට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. | 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021.03.03 දින විගණකාධිපති වෙත යොමු කර ඇත. | අමාත්‍යාංශය සතු සියලු වත්කම් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඉ) | අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි.110 ප්‍රකාරව පවත්වාගෙන යා යුතු පාඩු හා හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි. | මු.රෙ. 110 ප්‍රකාරව වාහන අනතුරු පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් නව ලේඛනයක් සකස් කර ගැනීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | විදුලිබල අමාත්‍යාංශය සහ විදුලිබල අමාත්‍ය කාර්යාලය සඳහා අවශ්‍ය කරනු ලබන මිලදී ගැනීම් අවශ්‍යතාවය සහ ඉල්ලීම මත පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණය ද සලකා බලා මිලදී ගැනීමට කටයුතු කරනු ලබයි. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1. ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි ඇතුළත් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් කාර්යභාරයන් ඉටු නොකිරීම, ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්, අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිලාභ මට්ටම් ලබා නොගැනිම පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන විදේශාධාර ව්‍යාපෘතිවල ක්‍රියාකාරි සැලැස්ම සකස් කර එහි ප්‍රගතිය කාර්තුමය වශයෙන් සමාලෝචනයට ලක් කරන අතර එහිදී මතු වූ ගැටළු සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත ද විගණකාධිපති වෙත 2021 මාර්තු මස 23 වන දින ඉදිරිපත් කර ඇත. | වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සඳහා වූ ප්‍රගතිය පිළිබඳ වාර්තාව සකස් කර විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

### 3.2.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **මෙ. වො. 31 මොරගොල්ල ජල විදූලි බලාගාරය ඉදිකිරීම** | | |
| මෙ.වො. 31 ක ධාරිතාවක් ජාතික විදුලි ජාලය වෙත ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක මොරගොල්ල ජල විදූලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, අවුරුදු 3 ක ප්‍රමාද කාලයකින් පසුව එනම් 2017 වර්ෂයේ දී මෙහි | ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රත්තුව අවුරුදු 02 ක් පමණ ප්‍රමාද විමත්, පාරිසරික ඇගයීම් වාර්තාව (EIA) සඳහා වූ අනුමැතිය ලැබීම ප්‍රමාද විමත්, 2020 වර්ෂයේදී | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරිමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| වැඩකටයුතු ආරම්භ කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන.18,809 ක් වූ අතර, මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් රු. මිලියන 28 කට ආසන්න මුදලක් (USD 177,931) දණ්ඩන ලෙස (commitment charges) ගෙවීමට සිදු වී තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 4,113 ක් වැය කර තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 27 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | COVID – 19 වසංගතය හේතුවෙන් ඇතිවූ විවිධ බාධාවීම් හේතුවෙන් ප්‍රමාද වීම ඇති වූ බව.<br>ආසියානු සංවර්ධන බැංකුව හා ගිවිසුම්ගත ණය මුදලට අදාල කොන්දේසි ප්‍රකාරව ණය මුදල නියමිත දිනට නිදහස් නොකිරීම (Disburse) හේතුවෙන් අදාල දණ්ඩනය (Commitment Charges) ගෙවීමට සිදු වූ බව. | |
| (ආ) **ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය** | | |
| බස්නාහිර, මධ්‍යම හා උතුරුමැද පළාත්වල ජාල උපපොළ ධාරිතාවය ඉහල නැංවීම හා සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 23,720 ක් වූ අතර, මෙය 2015 ජනවාරි මස ආරම්භ කර 2018 ජනවාරි මස නිම කිරීමට නියමිතව තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන්වී නොතිබුණි. තවද 2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිමකිරීමට නියමිතව තිබූ දින සිට වසර 3 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ මුදල රු. මිලියන 9,357 ක් වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 33 ක් වී තිබුණි. | JICA උපදෙස් අනුව කොන්ත්‍රාත්කරුවනගේ පූර්ව සුදුසුකම් පරීක්ෂණය සිදුකිරීම හා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම් හා ව්‍යාපෘති උපදේශකවරු පත්කිරීම සිදු වූ බැවින් ඒ සඳහා දිගු කාලයක් ගතවී ඇති බවත්, COVID 19 වසංගතය ඇතුළු හේතුමත නිශ්චිත දිනට කොන්ත්‍රාත්තුව නිමකිරීමට අපොහොසත් වී ඇති බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

(ඇ) **මෙ.වො. 35 ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| මෙගාවොට් 35 ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 9,424 ක් වූ අතර, මෙම ව්‍යාපෘතිය 2013 අගෝස්තු මස ආරම්භ කර 2017 අගෝස්තු මස නිම කිරීමට නියමිතව තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනට වඩා අවුරුදු 3 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 86 ක් වී තිබුණි. | 2018 වර්ෂයේ ජනවාරි මස ණය ගිවිසුම් කල් ඉකුත් වීමත් සමගම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සලසා ගැනීමේ අපහසුතාවයන් හා ප්‍රමාදයන් හේතුවෙන් මෙන්ම දැනට පවතින ගෝලීය COVID 19 වසංගත තත්වය හේතුවෙන්ද ව්‍යාපෘතියේ ප්‍රගතිය පසුබෑමට ලක්විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2.2 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විදුලිබල උත්පාදනය මගින් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීමේ අරමුණින් නාගදීප, අනලතිවු හා ඩෙල්ෆ් යන කුඩා දූපත් තුනෙහි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 2,172 ක් වූ අතර, අදාල ව්‍යාපෘතිය 2019 වර්ෂයේ ආරම්භ කර 2022 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 වන විටත් ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පැවති මෙම ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතියක් දක්නට නොලැබුණි. | මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු නිමකර ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය බලාපොරොත්තුවෙන් පසුවේ. ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ ආරම්භ කර නොමැති බැවින් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියක් දැක්විය නොහැකි බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 104 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 93 ක් වූයෙන් පුරප්පාඩු 11 ක් නිරීක්ෂණය විය. | අංක 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් විදුලිබල අමාත්‍යාංශය හා සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් අමාත්‍යාංශ දෙකක් බවට පත් විය. එමගින් මෙම අමාත්‍යාංශයේ තිබූ විෂය පථයෙහි තිබූ කොටසක් රාජ්‍ය අමාත්‍යාංශයට පැවරුණි. ඒ අනුව විදුලිබල අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය ද 104 ක් දක්වා අඩු කිරීමට සිදු විය. | අමාත්‍යාංශයට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂක (සැලසුම්), ප්‍රධාන ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු ඇතුලත්ව තනතුරු 05 ක පුරප්පාඩු පැවති අතර පුරප්පාඩු පිරවීම සඳහා වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරෙහි 2020.07.07 දින සිට රාජකාරි ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිලධාරිනියක පත් කිරීමට කටයුතු කර ඇත. අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන ගණකාධිකාරි සහ අභ්‍යන්තර විගණක යන තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා සේවා අවශ්‍යතාවය මත නිලධාරින් අනුයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. | අවශ්‍යතාවය පරිදි අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |
| (ඇ) | අමාත්‍යාංශයේ තෘතීය මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාව 4 ක් වූ අතර, එම මට්ටමේ තනතුරු 03 ක් එනම් පරිපාලන නිලධාරී හා භාෂා පරිවර්තක තනතුරු 2 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් පිරවීමට නොහැකි වී තිබුණි. | භාෂා පරිවර්තක තනතුරෙහි පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, පවතින තනතුරු පුරප්පාඩු සඳහා කඩිනමින් නිලධාරින් අනුයක්ත කර ගැනීම සම්බන්ධයෙන් වරින් වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | අවශ්‍යතාවය පරිදි අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍ය කාර්යය මණ්ඩලයෙහි අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන ආරක්ෂක නියාමක තනතුරු 2 ක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් දෙදෙනෙකු 2020 සැප්තැම්බර් මස සිට සේවයේ යොදවා ගෙන තිබුණි. | ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා සේවා අවශ්‍යතා මත ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ආරක්ෂක නියාමක තනතුරේ සේවය කරන සේවක මහතුන් දෙදෙනෙකු අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් 19 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයට යොදවා ගෙන තිබූ අතර ඇතැම් නිලධාරීන් 2009 වර්ෂයේ සිට අමාත්‍යාංශයට අනුයුක්තව තිබුණි. | අමාත්‍යතුමාගේ මාධ්‍ය ඒකකයේ පවතින තනතුරක රාජකාරි අවරණය කිරීම සඳහා සේවා අවශ්‍යතාවය මත දත්ත සැකසුම් ක්‍රියාකාරු තනතුර දරන්නා අනුයුක්ත කර ගන්නා ලද අතර, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් කාර්යාල සේවකයින් දෙදෙනෙකු හා අමාත්‍යාංශයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙකු මෙම අමාත්‍යාංශය සඳහා අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |